# ශුද්ධ වූ සභාව පිළිබඳ දෙවන වතිකාන මන්ත්‍රණ සභාවේ ධර්ම ව්‍යවස්ථාව (DOGMATIC CONSTITUTION ON THE CHURCH - *LUMEN GENTIU*):

## ඉතිහාස අධ්‍යයන ගවේෂණයක්


පී. ඩී. ටී. නෝනිස්

බටහිර සම්භාව්‍ය සංස්කෘතිය හා ක්‍රිස්තියානි සංස්කෘතිය අධ්‍යයන අංශය



දෙවන වතිකාන මන්ත්‍රණ සභාවේ **ශු. සභාව පිළිබඳ ධර්ම ව්‍යවස්ථාව** මගින් අපේක්ෂා කරන්නේ ආත්ම සෝදිසියක් මගින් සෑම කතෝලිකයෙකු ම එහි නිශ්චිත සාමාජිකයකු ලෙස සහභාගි කර ගැනීම යි.

ජී. ඇල්බෙරිගෝ (G. Alberigo) විසින් සම්පාදිත *History of Vatican II* නමැති ග්‍රන්ථ වෙළුම් පහ ප්‍රාථමික මූලාශ්‍රයක් (Primary Source) ලෙස භාවිතයට ගෙන මෙම ධර්ම ව්‍යවස්ථාව ලේඛනගත වීමේ පසුබිම විමසීම මෙම අධ්‍යයනයේ අරමුණ යි.

දෙවන වතිකාන මන්ත්‍රණ සභාවට පෙර කතෝලික සභාව ජනතාව ඉදිරියේ පෙනී සිටියේ දෘශ්‍යමාන පාලන තන්ත්‍රයකින් හා නීති මාලාවකින් ආණ්ඩු කළ සංස්ථාගත ස්වරූපයකිනි. ගිහි අපෝස්තලිකත්වයට අඩු සැලකිල්ලක් ලැබෙන පිරමීඩාකාර පරිපාලන ව්‍යුහයක් තිබීම, බයිබලීය අර්ථකථන විද්වතුන්ට පමණක් සීමා වීම, ඉගැන්වීමේ බලය මෙන් ම සභාව මෙහෙය වීම හා සියලු තීරණ ගැනීමේ අයිතිය සභා නායකත්වයට පැවරීම ආදි ගැටලු පැන නැගී තිබූ අතර ඒවා නිරාකරණයට ශු. සභාව පිළිබඳ ධර්ම ව්‍යවස්ථාව යොදා ගන්නේ කෙසේ ද යන්න එය විවාදයට ගත් සැසිවාර ලේඛන මගින් පුළුල් ව විමසීම මෙහි පර්යේෂණ ගැටලු වේ.

මෙම ගැටලු නිරාකරණය කිරීමේ දී තහවුරු වූයේ මෙම ධර්ම ව්‍යවස්ථාව පිළිබඳ ඇතිවූ වාද විවාද සභා නවෝදයකට මග පෑදූ බව ය. සභාව; ක්‍රිස්තුන් වහන්සේගේ ශුද්ධාත්මික ක්‍රිස්තු දේහය මෙන් ම දේව ජනතාව බවත්, සභා ශ්‍රේෂ්ඨයන්ට පැවරෙන දූත මෙහෙවර පිළිබඳවත්, ශු. සභාව තුළ ගිහියන් ක්‍රිස්තුන් වහන්සේගේ පූජක මෙන් ම දිවැසිවර හා රාජකීය ජීවිතයට පංගුකාර වන බවත් එහි ලා දැක්විය හැකිය.

ජී. ඇල්බෙරිගෝ විසින් සම්පාදිත *History of Vatican II* නමැති ග්‍රන්ථ වෙළුම් පහට අමතරව විශ්වකෝෂ, ශාස්ත්‍රීය ග්‍රන්ථ හා ලිපි, අන්තර්ජාලය ආශ්‍රයෙන් ද දත්ත ගොනු කොට තිබේ. මෙම නිබන්ධයට අදාළ දත්ත රැස් කර ගැනීම සඳහා යොදා ගත් පර්යේෂණ ක්‍රමවේද වශයෙන් ලේඛන, ඓතිහාසික හා මූලාශ්‍රය විමර්ශනයන් දැක්විය හැකිය.



**මූලික පද:** ශු. සභාව, දේව ජනතාව, දේවධාර්මික ව්‍යවස්ථාව